Article 12(1)


# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.      ඔබේ අංකය / உமது இல. / Your No.      දිනය / திகதி / Date 2019-10-30

පැමිණිලිකරු/වන් : එම්. සි. විජේරත්න මිය,
18/5, ලේවැල්ලගම,
ගුන්නෑපාන.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පතිනිය,
මහාමායා විද්‍යාලය,
මහනුවර.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/K/424/17-W</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමන්ගේ දියණිය වන සෙත්මි විහන්සා කුලතුංග 2017 වර්ෂයේ මහාමායා විද්‍යාලයට ආදි ශිෂ්‍ය පදනමින් ඇතුළත් කිරීමට අයදුම් කළ බවත්, ඊට අදාළ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසු ආදි ශිෂ්‍ය පදනම යටතේ ළමුන් ඇතුළත් කර ගැනීමේ පොරොත්තු ලේඛනයේ දෙවැනි ස්ථානය හිමි වූ බවත්ය. ඉන් පසුව අදාළ පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයෙහි සිටි දැරිය පාසලට ඇතුළත් වූ පසු තම දියණිය පොරොත්තු ලේඛණයේ පළමු ස්ථානයට පත් වූ බවත්, ඉන් පසුව තවත් ආදි ශිෂ්‍ය පදනම යටතේ ඇතුළත් වූ දියණියක් පාසලෙන් ඉවත් වූ බැවින් පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙල අනුව තම දියණියට පාසලට ඇතුළත් වීමට සුදුසුකම් ලද බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත. ඒ අනුව ඒ පිළිබඳ පැමිණිලි පාර්ශවය විදුහල්පතිතුමියගෙන් ඉල්ලීමක් කරන ලද බවත් ඒ සඳහා විදුහල්පතිතුමිය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමියගේ උපදෙස් පතා 2017.05.15 දින ලිපියක් යොමු කර ඇති බවත්, එහෙත් ඒ වන විට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ED/1/6/AD/2017 (අධිකරණ) හා 2017.05.04 දිනැති ලිපිය මඟින් වෙනත් ශිෂ්‍යාවක් පාසලට ඇතුළත් කිරීම අනුමත කර තිබූ බවත් ඒ අනුව මේ වන විට පංතියක සිටිය හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව (39) සම්පූර්ණ වී තිබෙන බැවින් තම දියණිය පාසලට ඇතුළත් කිරීම විදුහල්පතිතුමිය විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් තම දියණියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පැමිණිලි පාර්ශවය විසින් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පළමු වගඋත්තර පාර්ශවය වන මහනුවර මහාමායා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් වාර්ථාවක් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවට අනුව, පැමිණිලිකාරිය ආදි ශිෂ්‍ය ගණය යටතේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට කඩඉම් ලකුණු සීමාව කරා ප්‍රවිශ්ය නොවීම හේතුවෙන් සිසුන් ඇතුළත් කිරීමේ අවසාන ලැයිස්තුවට ඇතුළත් නොවූ බවත් පොරොත්තු ලේඛණයේ දෙවන ස්ථානය හිමි වූ බවත් සඳහන් කර ඇත. පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයේ සිටි දරුවා පාසලට ඇතුළත් වූ පසුව පැමිණිලිකාරියගේ දරුවා පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයට පත් වූ බවත්, ඉන් පසුව ආදි ශිෂ්‍ය ගණය යටතේ ඇතුළත් කළ තවත් සිසුවියක් 2017.04.26 දින පාසලෙන් ඉවත් වීම හේතුවෙන් පුරප්පාඩු ඇති වූ පසු අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම්ගේ අංක ED/1/6/AD/2017 (අධිකරණ) හා 2017.04.18 දිනැති ලිපිය මඟින් විනුදා වෙනුකලි මුණසිංහ නැමැති දරුවා පළමු ශ්‍රේණියට ඇතුළත් කරන ලෙස දන්වා ඇති බැවින් ජාතික පාසල් අධ්‍යක්ෂ විසින් විදුහල්පතිනිය වෙත ලබාදුන් උපදෙස් පරිදි 2017.03.04 මෙම ශිෂ්‍යාව පාසලට ඇතුළත් කළ බව විදුහල්පතිනිය සඳහන් කර ඇත. මෙම පැමිණිලි පාර්ශවය තම දියණිය ඇතුළත් කිරීමට ඉල්ලුම් කිරීමේදී පංතියක සිටි උපරිම සිසුන් සංඛ්‍යාව සම්පූර්ණ වී ඇති බැවින් පැමිණිලිකාරියගේ දියණිය ඇතුළත් කර නොහැකි බවද පැමිණිලි පාර්ශවයට දැනුම් දී ඇති බවත් සඳහන් කර ඇත.

දෙවන වගඋත්තරකාර පාර්ශවය වන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් ජාතික පාසල් ශාඛාව හරහා වාර්ථාවක් යොමු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ දියණියට ආදි ශිෂ්‍ය ගණයට අදාළ පොරොත්තු ලේඛනයේ දෙවැනි ස්ථානය හිමිව තිබූ බවත්, එම ගණය යටතේ පාසලට ඇතුළත් වූ ශිෂ්‍යාවන් දෙදෙනෙක් පාසලින් ඉවත් වූ පසුව තම දියණියට පාසලට ඇතුළත් වීමට අවස්ථාව හිමි විය යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැමිණිලිකාරිය කරන ලද පැමිණිල්ලෙහි සඳහන් වී ඇති බවත්, එහෙත් ඒ වන විට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ දරුවන් ඇතුළත් කිරීම යටතේ මෙම පාසලේ පළමු ශ්‍රේණියට දියණියක් ඇතුළත් කිරීමෙන් පංතියක සිටි හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වී ඇති බැවින් පැමිණිලිකාරියගේ ඉල්ලීම පිළිබඳ විදුහල්පතිනිය අධ්‍යාපන අමාත්‍යාශයෙන් උපදෙස් විමසා තිබූ බවත් ඒ

අනුව පැමිණිලිකාරියගේ දැරිය පාසලට ඇතුළත් කිරීම අනුමත කළ නොහැකි බවට විදුහල්පතිනිය වෙත දැන්වූ බවත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :-**

2017.10.25 දින පැවැති මූලික පරීක්ෂණයේදී පළමු වගඋත්තර පාර්ශවය වන මහනුවර මහමායා විද්‍යාලයේ විදුහල්පතිනිය නියෝජනය කරමින් එම්.එම්.ජී.සී. රත්නායක ගුරු මහත්මිය සහභාගි වී ඇත. එහිදී, ආදි ශිෂ්‍ය ගණය යටතේ ඇතුළත්ව සිටි අංක 23296 ට අදාළ පී.ඒ. උඩවල්පොල දෙමාපියන්ගේ දියණිය 2017.04.26 දින පාසලින් ඉවත් කරගත් බවත්, ඒ වන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ ED/1/0/1/1/AD/2017 (අධිකරණ) හා 2017.04.18 දිනැති ලිපිය මඟින් විනුදා මූණසිංහ ශිෂ්‍යාව ඇතුළත් කිරීමට නිර්දේශ කර තිබූ බවත්, නමුත් එම දියණිය 2017 පළමු වසර සඳහා මෙම විද්‍යාලයට අයදුම් පතක් යොමු කිරීමක් හෝ සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වීමක් කර නොමැති බවත්, සඳහන් කර ඇත.

චක්‍රලේඛනානුකූලව පුරප්පාඩුවක් ඇති වුවහොත් පොරොත්තු ලේඛනයට අනුව එම පුරප්පාඩුව පිරවිය යුතු නමුත් ඉහත දියණිය ඇතුළත් කර ගැනීම හේතුවෙන් පැමිණිලිකාර එම්.සී. විජේරත්න මහත්මියගේ දියණිය වන විහන්සා කුලතුංග දියණියට අසාධාරණයක් සිදු වී ඇති බවද වගඋත්තර පාර්ශවය විසින් පිළිගෙන ඇත.

එසේම මේ වන විට පවතින පංතිවල සිටින සිසුන් සංඛ්‍යාව විදුහල්පතිනිය විසින් කොමිසම වෙත යොමු කර ඇත. ඒ අනුව 1A ශ්‍රේණියේ සිසුන් 40 ක්ද, 1B ශ්‍රේණියේ සිසුන් 39ක්ද, 1C ශ්‍රේණියේ සිසුන් 39ක්ද, 1D ශ්‍රේණියේ සිසුන් 39ක්ද, 1E ශ්‍රේණියේ සිසුන් 38ක්ද වශයෙන් සිසුන් සිටින බවට දක්වා ඇත.

එසේම පැමිණිලි පාර්ශවයට අසාධාරණයක් සිදු වී ඇති බැවින් ඇයව ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් 2017.10.27 දිනැති ලිපිය මඟින් විදුහල්පතිනිය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් විමසා ඇති බවද නිරීක්ෂණය වේ.

2017.11.10 දින පැවැත්වූ මූලික පරීක්ෂණයේදී දෙවන වගඋත්තරකාර පාර්ශවය වන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කරමින් පැමිණි නියෝජ්‍ය අධ්‍යක්ෂ (ජාතික පාසල් අංශය) එම්.ආර්.එම්. ඉර්ෂාන් මහතා ප්‍රකාශ කර ඇත්තේ, මෙම පුරප්පාඩු ඇති වී ඇත්තේ 2017.04.26 දින බවත් ඊට පෙර 2017.04.18 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම (අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම මත) යොමු කර ඇති බවත් , ඒ අනුව 2017.05.04 දින විනුදා වෙනුකුලී මූණසිංහ දියණිය පාසලට ඇතුළත් කරගෙන ඇති බවත් ය.

එසේම පොරොත්තු ලේඛනයේ ඇතුළත් දරුවෙකුට අවස්ථාව ලැබෙනුයේ අවසන් තේරීම් ලේඛනයට අනුව පාසලට ඇතුළත් කර ගන්නා අවස්ථාවේ දී යම් අයෙකු පාසලට ඇතුළත් නොවීම හේතුවෙන් එම අවස්ථාවේ අවසන් ලේඛනයේ පුරප්පාඩුවක් ඇති වුවහොත් පමණක් බවත්, පාසලට ඇතුළත් කොට ඇතුළත් වීමේ අංකයක් හිමි දරුවකු ඉවත් වුවහොත් එකී පුරප්පාඩුව සඳහා පොරොත්තු ලේඛනයේ සිටින දරුවකු ඇතුලත් කිරීමේ වගකීම විදුහල්පතිනියට සලකා බැලිය හැකි බවත් සඳහන් කර ඇත.

නිරීක්ෂණ හා නිගමන :-

මහනුවර මහමායා විද්‍යාලයේ විදුහල්පතිතුමිය විසින් පළමු වසරේ ඇතුළත් කර ගැනීමේදී ආදි ශිෂ්‍ය පදනම මත ඇති වූ පුරප්පාඩුව පිරවීමේදි චක්‍රලේඛනයේ දක්වා ඇති පරිදි පොරොත්තු ලේඛනයේ සුදුසුකම් ලැබූ අය ඇතුළත් නොකොට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් යොමුකරන ලද ලිපියකට අදාළව චක්‍රලේඛනයෙන් පරිබාහිරව ඇතුළත් කිරීම් සිදුකර කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පොරොත්තු ලේඛනයේ ඇතුළත් දරුවෙකුට අවස්ථාව ලැබෙනුයේ අවසන් තේරීම් ලේඛනයට අනුව පාසලට අතුළත් කර ගන්නා අවස්ථාවේ දී යම් අයෙකු පාසලට ඇතුළත් නොවීම හේතුවෙන් එම අවස්ථාවේ අවසන් ලේඛනයේ පුරප්පාඩු ඇති වුවහොත් පමණක් වුවද, ඒ වෙනුවට අයදුම් පතක් යොමු නොකළ, සම්මුඛ පරීක්ෂණයකටත් පෙනී නොසිටි දැරියක පාසලට ඇතුළත් කර ගැනීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරියගේ දියණිය වන සෙත්මි විහන්සා කුලතුංග දියණිය වගඋත්තරකාර විද්‍යාලයේ 2019 වර්ෂයේ තෙවන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිමි.

2019.0 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

2019.11.29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ගරු අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/